වලපනේ ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

---------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 06 දින ලේකම්වරයාට යවා ඇත.

1.2. මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-----------------------------------------

1.3.1 අවිනිශ්චිත ගිණුම
-------------------

2014 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු.5,497ක් වූ අතර එම ශේෂයට පාදක වූ හේතු පරීක්ෂාකර බලා නිරවුල් කිරීමට විගණන දිනවූ 2015 අප්‍රේල් 08 වන විටත් කටයුතු කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු ගිණුම්
--------------------

2014 දෙසැම්බර් 31 දිනට අයකර ගතහැකි උපයෝගී සේවා ගිණුම් ශේෂයේ වටිනාකම රු.40,049,134ක් වූ අතර එයින් රු.1,753,856ක් වසර එකක කාලයක් ඉක්මවා තිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

---------------------

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02ක එකතුව රු.50,034,246ක් වූ අතර එයින් වසර එකක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.13,735,771ක් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

(අ) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.19,908,636ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට නොහැකි වුණි.

(ආ) සභාව 2014 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණ බැවින් රු.5,513,959ක් වටිනාකම වූ කාර්යාල උපකරණ, ලී බඩු සවිකිරීම්, පුස්තකාල පොත් සහ පොදු ගබඩා ශේෂයන් පිළිබඳව විගණනයේදී සතුටුදායක අන්දමින් සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

1.3.5 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

-----------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159වන වගන්තිය | සභාවට අයවිය යුතු ආදායම් යාවත්කාලීනව අයකරගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දින වන විට රු.3,464,615ක හිඟ මුදලක් අයවිය යුතුව තිබුණි. |
| (ආ). ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 218 | සභාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් කර නොතිබුණි. |

i.

| | |
|---|---|
| (ඇ). ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.6 වගන්තිය | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීගිය, සේවය අත්හිටුවා ඇති, මියගොස් ඇති හා විස්තර හඳුනාගත නොහැකි සේවකයින් 75 දෙනෙකුගෙන් අයවිය යුතු රු.312,600ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,168,770ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,991,713ක් වූයෙන් අතිරික්තයේ රු.2,177,057ක වැඩිවීමක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමඟ සැසඳීමේදී රු.2,177,057ක වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2014 වර්ෂයේදී ආදායම් විෂයයන් 05ක ආදායම සියයට 05 සිට සියයට 56ක පරාසයකින් වැඩිවීමත් වියදම් විෂයයන් 07ක වියදම සියයට 08 සිට සියයට 71 දක්වා වූ පරාසයකින් අඩුවීමත් හේතු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

<u>අයකිරීම්</u>

| ආදායම් විෂයය | 2014.01.01 දිනට හිඟය | 2014.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2014 දෙසැම්බර් 31 මුළු හිඟය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 1,588,879 | 412,799 | 2,068,041 | 1,313,332 | 1,930,789 |
| කඩ කුලී | 1,293,248 | 320,042 | 1,282,650 | 705,555 | 1,550,301 |
| බලපත්‍ර ගාස්තු | - | - | 1,837,460 | 1,837,460 | 0 |
| වෙනත් | 2,535,598 | 114,911 | 3,555,871 | 3,262,687 | 2,714,482 |

2.3.2 වරිපනම් බදු

2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,930,789ක හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 33 වෙනි රීතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,632,139 |
| මුද්දර ගාස්තු | 2,893,030 |

2.3.4 ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු

සභා බලප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගැසට් කර තිබුණ ද විධිමත් පරිදි සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 අධිභාර

--------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව ම විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද රු.29,975ක අධිභාර මුදලක් 2014 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම

----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම තහවුරු කරගැනීම සඳහා භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

3.2.1 පෙරසවි ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය

--------------------------------------

සභාව මසකට රු.100,000ක පමණ මාසික ආදායමක් උපයමින් පැවති, 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ පෙරසවි ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය 2014 වර්ෂය තුළ විධිමත්ව ක්‍රියාත්මක නොකිරීම නිසා සභාවට විශාල ආදායමක් අහිමිවී තිබුණි.

3.2.2 නිශ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------

සභාව සතු වත්කම් විෂයයන් 11ක් දීර්ඝ කාලයක් තිස්සේ නිශ්කාර්යයව පැවතුණි.

3.2.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර, පරිසරයට හානිකර පරිදි රාගල ලින්ස්ඩේල් වත්තට කසළ බැහැර කරමින් පැවතුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අයවැය පාලනය.
--------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 07ක සියයට 09 සිට සියයට 109 දක්වාද වියදම් විෂයයන් 07ක සියයට 07 සිට සියයට 247 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූණි.

5. පද්ධති හා පාලන.
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ආදායම් පරිපාලනය

(ආ). අභ්‍යන්තර පාලනය.

(ඇ). ගිණුම්කරණය.

(ඈ). ණයගැති ණයහිමි පාලනය.

(ඉ). වත්කම්වල කළමනාකරණය .